# මිනිසත් බවේ මහිමය...



ලෝක වාසී සත්ත්ව සන්තතියේ උත්තම සත්ත්වයා මනුෂ්‍යයා බව "මනුස්සත්තං ලිංග සම්පත්ති හේතු සත්ථාර දස්සනා..." ආදී වශයෙන් බුදුරදුන් විසින් දේශනා කොට ඇත.

"දුල්ලභංච මනුස්සත්තං..." වශයෙන් ද, ලෝක සත්ත්ව සන්තතිය තුළ මිනිස් ආත්මයක උපත ලැබීම මහත් භාග්‍යයක් ලෙස ද උන්වහන්සේ වදාළහ.

එබඳු දුර්ලභ උත්තම වූ මිනිසත් බවක් ලද පුද්ගලයාට එහි ඇති ශ්‍රේෂ්ඨභාවය පුණ්‍යභාවය බොහෝ විට වැටහී නැති බව සමාජය විමසා බැලීමෙන් අපට වැටහී යන අවස්ථා එමට ය.

සම්බුදු රදුන් ඒ පිළිබඳව ද විවරණයන් සිදු කර ඇත. "තානත්ත කායා මහනත්ත සඤ්ඤා, ඒ කත්ත කායා නානත්ත සඤ්ඤා..." වශයෙන් ලෝක ධාතුව තුළ එක් එක් මනුෂ්‍යයා හීම් සමුදාය, ක්‍රියා කලාප, ආචාර සමාචාර, ගුණ දහම්, කුසල් අකුසල්, හැඩ රුව, උගත් නූගත්කම්, වත් පොහොසත් කම්, ලාභ සත්කාර, තනතුරු නම්බුනාම, රැකියා විරැකියා, උස් පහත් බව, ලෙඩ දුක්, වාසස්ථාන, සැප දුක්, දරු මුනුපුරු ආදි වශයෙන් වෙනස්කම් ඇති බව නොරහසකි.

එබඳු වෙනස්කම්වලට භාවිතය වී අපි යම් තලයකට හඳුනාගත් මනුෂ්‍යයකු ද එක් එක් කාලවකවානුවලදී විවිධ පරිවර්තනයන්ට ලක් වනු දැකිය හැකි ය. එබඳු මනුෂ්‍යයන්ට සමහර විටකදි සමාජය විසින් අදහන්න බැරි මිනිහෙක් වශයෙන් හඳුන්වනු ලබන්නේ එබඳු මිනිසුන්ට බව ද කිව යුතු ය.

මෙසේ දීර්ඝව සසර ගමනක කණ කැස්බා විය සිදුරෙන් එළිය දුටුවා සේ ලබාගත් දුර්ලභ මිනිසත් බව ය, ගමන් ගත කරන්නේ සුගතියට ද දුගතියට ද යන බව හඳුනාගත යුතු වැදගත් සන්ධිස්ථානයකි. තමාට උරුම වූ මනුෂ්‍යාත්මය තමා විසින් ධර්මානුකූලව තේරුම් ගත් පුද්ගලයකු වීමේ භාග්‍යය හැම මනුෂ්‍යයකුට ම අවබෝධ නොවීම සසර ගමනේ සසර පුරුදු ලෙස බුදුරදුන් දේශනා කොට ඇත. සසර පුරුදු ලෙස යමකුට වැරැදි මඟකට ප්‍රවේශ වීමක් සිදු වී තිබුණ ද නූතන ජීවිත අත්දැකීම් හා සමාජ අත්දැකීම් පදනම් කරගෙන තම ජීවිතය යහපත් ප්‍රවේශයකට යොමු කරගත හැකි ය. ආගමට දහමට ළැදිව බණ දහම්, පොත පත පරිශීලනය කිරීමෙන් එම අත්දැකීම් උකහා ගත හැකි යි.

"තිතිමඤ්ඤදතරං යාමා පටිජග්ගෙය්‍ය පණ්ඩිතෝ" යන බුදු වදන අනුව බාල තරුණ * මහලු යාම තුනෙන් එක් යාමයක හෝ ඥාණවන්ත පුද්ගලතෙම ජීවිතය හරි මඟට ගෙන සසර ගමන යහපෝෂණයකට ප්‍රවේශ කරනු ඇත.

ලබාගත් මිනිස් බව ය යහපත් ගමනක යෙදවීම තුළ දියුණු බවයෙන් බවයට නොසිඳී ගමන් ගත වන විඤ්ඤාණය යහපත් ගමනක යෙදවීම තුළ දියුණු විඤ්ඤාණ ධාතුවක් තමන් සතු වනු ඇත. බවයෙන් බවයට නොසිඳී ගමන් ගත වන විඤ්ඤාණය යහපත් ගමනක යෙදවීම තුළ දිව්‍ය මනුෂ්‍ය ආත්ම භා-වයන් ලබමින් අවසන නිර්වාණ ධාතුව කරා හසුරුවනු ඇත.

පඤ්චකාමයෙහි ඇලී ගැලී පමණක් නොව එහි ගිලී ජීවත් වන මනුෂ්‍යයාට බොහෝ විට ජීවිතයේ ආදී නව පැත්ත දර්ශනය නොවිය හැකි ය. එබඳු පුද්ගලයාට ඉපදීම දුකක් බව අමතක වී තිබුණත් කාලයාගේ ඇවෑමෙන් දිරා පත්වීම දුකක් යී යන බුදු වදන වත් නොවැටහිය හැකි ය. එවිට දිරාපත් සිරුර තුළින් ද කම් සැප පසුපස ගමන් ගත වීමට අවකාශ ඇත. ජීවිතය සුන්දරයි නාම පුවරුව බුදුන් වහන්සේ දැක්කේ අට්ඨීනං කතං නගරං ආදී වශයෙන් මිනිස් සිරුර ඇට ගොඩක් හසුරුවා කරන ලද නගරයක් ලෙසිනි. සබ්බේ සංඛාරා අනිච්චා යන බුදු වදන අනුව ඇට ගොඩකින් නිම වූ සිරුර අනිත්‍ය සේ ම, ඉදිකිරීම් රැසකින් අලංකාර වූ නගරය ද අනිත්‍ය බවකි.

මෙබඳු ස්වභාවයක් දරන දුර්ලභ මිනිස් බවය තුළින් ගත හැකි පලය ලෙස බුදු රදුන් හඳුනාගත්තේ කුමක්ද?

අප්පමාසු මනුස්සානං
හීලෙය නං සපෝරිසෝ
චරෙයාදිත්ත, සීසෝව
නත්ථී මච්චුස්ස නාගමෝ

ආදී වශයෙනි. මනුෂ්‍යයාගේ ආයුෂ ඉතා අල්ප ය. එම සුළු ආයු ප්‍රමාණය සසර දුක මිනිස් බවය හඳුනාගත් යහපත් පුද්ගලයෝ පිළිකුල් කරති. හිස ගිනිගත් අයකු එම ගිනි නිවන්න වෙහෙසෙන සේ කුසල් දහමින් වහා හැසි-රෙනා හ. මාරයාගේ පැමිණම කුමන මො-හොතක වනවා දැඩයි කිව නොහැකි බැවිනි. අනිවාර්යයෙන් ම මාරයා පැමිණෙන බැවිනි.

ලැබුණු දුර්ලභ මිනිස් භවය සුගතිගාමී කරගනු පිණිස දෙලොව සතුටු විය හැකි කුසල ධර්මයන්හි හැසිරෙමින් මිනිස්කම අර්ථවත් කරගන්නා මඟ ශක්තිමත් කර ගැනීමට මේ ධර්ම කරුණ ද ඉවහල් වේවා!

**රාජා ජයවර්ධන**

13 වන පිටෙන්

අංශයෙහි ප්‍රධානියා ලෙස කලාව හා ආශ්‍රිත තම පරිපාලන ජීවිතය ඇරැඹුවත්, පරිපාලන රෙගුලාසි, මුදල් රෙගුලාසි (සෘ ) ඍසෘ) තම සිනමා කලාවේ කටයුතු නිදහස්ව කරගෙන යෑමට බාධාවක් වීයැයි සිතූ නිසාදෝ ඉන් ඉවත්වූ බව පැවැසේ.

වෘත්තාන්ත සිනමාව සමඟ ඩී. බී. නිහාල්සිංහ දායකත්වය ඇරැඹෙන්නේ, සිංහල සිනමා වංශකතාවේ විශිෂ්ටතම, එනම් පණස් වසරක සිනමාවේ හොඳ ම චිත්‍රපට අතර පස්වන ස්ථානය ගන්නා මහාචාර්ය සිරි ගුනසිංහගේ සත්සමුදුර චිත්‍රපටයේ කැමරා අධ්‍යක්ෂවරයා හා සංස්කරණ ශිල්පියා ලෙස දායක වීමෙනි. සිංහල චිත්‍රපටයක, සමීප රූප කෙතරම් කලාත්මකව හා සිනමාරූපීව භාවිත කොට තිබුණේ ද යන්නට මත නිදසුනක් වූ සත්සමුදුර කැමරාකරණය, එදවස පැවැත්වූ සිනමා



වැලිකතර - ජෝ සුවිනීතා

උළෙළකදී සැලකිල්ලට නොගෙන, එහි සංස්කරණය සඳහා හිමි සම්මානය පමණක් නිහාල්සිංහට පිරිනැමීම, ආන්දෝලනාත්මක විනිශ්චයක් සේ සැලකුණ ද, එය නිහාල්සිංහ නම් සිනමාකරුවාගේ ගමන් මඟ හා ඔහුගේ අනාගත දිශානතිය සටහන් කළ කඩඉම් චිත්‍රපටය වීය.

කාලයට එරෙහිව, සටන් වදින්නකු ලෙස ප්‍රකට නිහාල්සිංහ, ජී. ඩී. එල්. පෙරේරාගේ දහසක් සිතුවිලි චිත්‍රපටයේ රූ ගතකිරීම් සියල්ල දින දහයක් වැනි ඉතා කෙටි රූගත කිරීම් කාල සටහනක් තුළ නිම කළේය. චිත්‍රපට අධ්‍යක්ෂණයේ විශිෂ්ටතමයාගේ භූමිකාවට ඩී. බී. නිහාල්සිංහ හිමිකම් පාන්නේ, 1971 දී, කැමරාකරණය, සංස්කරණය, සම නිෂ්පාදනය හා අධ්‍යක්ෂණය යන සියලු අංශ තුළ තම ආධිපත්‍යය පතුරුවමින් සිංහල සිනමා වංශ කතාවේ, ස්වර්ණ ජයන්ති (1947 * 1977) විශිෂ්ට චිත්‍රපට අතර දහවන ස්ථානය හිමිකර ගත්, වැලිකතර චිත්‍රපටය වෙනුවෙනි.

සිනමානුරූපී ගුණය, පරිසමාප්ත තිර රචනය, විශිෂ්ට රූප පද්ධතිය වැලිකතර විශිෂ්ට කෘතියක් වීමේ සාධක වේ. ඔහුගේ අධ්‍යක්ෂණයෙහි ප්‍රතිභාව යළි යළිත් සාක්ෂාත් කර ගැනීමට නම්, වැලිකතරෙහි රංගන ත්‍රිත්වය, ගාමිණී, සුවිනීතා හා ජෝගේ රංගන ප්‍රතිභාව රූප රාමුවෙන් රාමුවට විමසා බැලිය යුතු ය. මේ විශිෂ්ට නළු නිළි ත්‍රිත්වයේ රංගනය සූරා ගැන්මට සමත් වන්නේ නිසැක වශයෙන් ම අධ්‍යක්ෂවරයාගේ අණසක බවයි මගේ හැඟීම. විචාරකයන්ගේ හැඳින්වීම් අනුව, ගතවූ අඩසියවස තුළ, නිහාල්සිංහගේ වැලිකතර පරදවන්නට සමත් වූ වීර කාව්‍යයත් නිර්මාණය වී නොමැත.

නිහාල්සිංහගේ සෙසු සිනමා කෘති අතර, රිදී නිම්නය, කෙළිමඩල හා මල්දෙණියේ සිමියොන් නම් චිත්‍රපට වන අතර, මල්දෙණියේ සිමියොන් චිත්‍රපටයේ ප්‍රධාන භූමිකාවට හිමිකම් පෑ අනෝජා වීරසිංහ, 1987 එකොළොස් වන නවදිල්ලි චිත්‍රපට උළෙළේදී, හොඳම නිළියට පිදෙන ස්වර්ණ මයුර සම්මානයෙන් පුද ලැබීම මඟින්ද ප්‍රකට කෙරෙනුයේ නිහාල්සිංහ නම් අධ්‍යක්ෂවරයාගේ අධ්‍යක්ෂණය පිළිබඳ ගැඹුරු ඥානයයි.

ශ්‍රී ලාංකේය සිනමා කලාව හා කර්මාන්තය පිළිබඳ, ඓතිහාසික යුගයක ඇරැඹුම රාජ්‍ය චිත්‍රපට සංස්ථාව බිහිවීමත් සමඟ සිදු විය. 1972*78 කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය චිත්‍රපට සංස්ථාවේ ප්‍රධාන විධායක හා සාමාන්‍යාධිකාරී ධුර හොබවමින්, නිහාල්සිංහ, තමා හුදු චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකු, කැමරා ශිල්පියකු හෝ සංස්කාරකවරයෙකු පමණක් නොවන බව ලොවට හඬගා පවසමින් පරිපාලකයෙකු ගේ උස් ආසනයක් හෙබවීමට තරම් ඔහු සතු වූ ඥානය විශද කොට සිටියේ ය.

මෙරට කලාවෙහි විශිෂ්ටයන් වූ බොහෝ දෙනා පරිපාලනමය වගකීම් ඉටුකිරීමෙහිදී අසාර්ථකයන් වූ බව ප්‍රකට කොට ඇති මුත්, සිනමා කලාව හා කර්මාන්තය මෙන්ම මානව සම්පත් කළමනාකරණයෙහි ද, දක්ෂයෙකු ලෙස සියලු අංශ සමබරව තබා ගනිමින් නිහාල්සිංහ ඉටුකළ කාර්ය සාධනය විශිෂ්ට ය. සිනමාවෙන් රූපවාහිනී ටෙලි නාට්‍ය නිර්මාණයට ආගමනය වූ ලබන නිහාල්සිංහගේ භූමිකා, මෙරට ටෙලි නාට්‍ය වංශකථාවෙහි ද සටහන් වී ඇත්තේ ඔහුගේ සිනමා වාර්තා මෙන්ම විශිෂ්ට වාර්තා ලෙසය.

ටෙලි නාට්‍ය ඉතිහාසයෙහි ප්‍රථම වර්ණ ටෙලි නාට්‍යය වූ දිමුතු මුතු ඔහුගේ මහරු ඵලයකි. අද දවසේ වුව, නිසරු ටෙලි නාට්‍ය නරඹා හෙම්බත් වී සිටින ප්‍රේක්ෂකයනට දිමුතු මුතු ගෙනෙනා ආස්වාදය මිහිර සුන්දර ය. රේඛා සංගීතමය ටෙලි නාට්‍යය මෙන්ම, සුදු සහ කලු ටෙලි නාට්‍ය ද නවකයන් මෙන්ම ප්‍රවීණයන් ද පුංචි තිරයට හඳුන්වා දුන් නිහාල්සිංහ නිෂ්පාදන වේ. දේවිකා මිහිරාණි, අමරසිරි කලන්සූරිය, චන්ද්‍රලේඛා පෙරේරා, ලක්ෂ්මන් විජේසේකර හා ගාමිණී ෆොන්සේකා ආදීහු ඒ අතර වෙත්.

ආචාර්ය ඩී. බී. නිහාල්සිංහ සිංහල සිනමා හා ටෙලි නාට්‍ය වංශකථාවේ දීර්ඝතම පරිච්ඡේදය ලියූ විදග්ධ කලාකරුවාශ මහා පුරුෂයා ය.

silumina.lk

